

# හිටපු ඉන්දීය විදේශ ලේකම් මිලින්ද හමුවෙයි

ඉන්දියාවේ කාලිංග ජාත්‍යන්තර පදනම හා පාත්ෆයින්ඩර් පදනම හා එක්ව සංවිධානය කළ විශේෂ එක්දින වැඩමුළුවක් පසුගියදා කොළඹ දී පැවැත්විණ. ඉන්දු ශ්‍රී ලංකා සම්බන්ධතා අරභයා විවිධ පැතිවලින් මෙහෙයවන ලද මෙම සාකච්ඡාවට සහභාගී වූ කාලිග පදනමේ සභාපති සහ ඉන්දියවේ හිටපු විදේශ ලේකම් ලලිත මාන්සිං මහතා ඇතුළු නියෝජිතයන් පාත්ෆයින්ඩර් නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා මුණ ගැසුණි.

එහිදී ලලිත මාන්සිං මහතා ගෞතම බුදුරජාණන් වහන්සේ පළමුවරය කපිලවස්තු පුරයට පැමිණීම සනිටුහන් කරන, ඔඩිස්සා ප්‍රාන්තයේ ශිල්පියෙකුගේ දියසායම් චිත්‍රයක් පිරිනමන අවස්ථාව ඡායාරූපයේ දැක්වෙන අතර කාලිංග පදනමේ නියෝජිතයන් වන රජීව් සෙහාර්, නානාපති අනුප් මුදාගල්, මහාචාර්ය එස්.ඩී. මුණි සමග පාත්ෆයින්ඩර් පදනමේ ජ්‍යෙෂ්ඨ සාමාජික ලලිත් වීරතුංග සහ ආචාර්ය වල්සන් වෙතොඩි යන මහත්වරු එක්වූහ.

**ගාමිණී සරත් ගොඩකන්ද**